




සිසිර දිසානායක

# "පන්ති මිත්‍ර සංසදය"



"ඊයේ රෑ තමයි රෑ ....!"පන්හිඳ කිව්වා.

"අපි එනකොට කීයද වෙලාව ?" පින්සල ඇහුවා.

"පාන්දර තුනට විතර ඇති මගේ හිතේ ..." පැන්සලත් ඇඳෙන් බිමට පැන්නා.

මෙහේ ඉන්න අයට මේ වාගේ කතා බහ අළුත් දේවල් නෙවි. පහුවද නිවාඩු දවසක් නම් නෑ හිතවත්තු එක්ක සාද පවත්වන එක අරුමයක් නෙවි. ඊත් අපේ තුන්දෙනා එකතු වුණේ ටිකක් වෙනස් සාදයකට.

ඒක පන්ති මිත්‍රයන්ගේ සාදයක්. එක එක අවුරුදු වලදී එක පන්තියේ ඉගෙනගත්ත විසි දෙනෙක් විතර එකතුවෙලා උන්නා මගෙ හිතේ. එකතුවෙන්න කාරණාව වුණේ ලංකාවෙන් ආව තවත් පන්ති මිත්‍රයෙක් !

"ඉස්කෝලෙන් අයින් වෙලත් කොච්චර කල් ද ? " පන් ඇඟිලි ගනින්න ගත්තා.

"අතේ ඇඟිලි වලින් නම් ගණින්න බැරි වෙයි. " පින් පන්ගේ කකුල්වල ඇඟිලිත් ගණින්න එකතු වුණා.

"සමහරුන්ව මං දැක්කෙම ඉස්කෝලෙන් අයින් වුණාට පස්සෙයි." පැන් ඒ ගැණිල්ලට එකතු වුණේ නෑ. සමහරු හරියට වෙනස් වෙලා. සමහරු තාමත් ඒ හැඩරුවමයි. අර වයසට යන කොට වෙන වෙනස්කම් විතරයි. ඉසකෙස් පැහිලා, තට්ට පෑදිලා, බඩවල් නෙරලා... තව තව දේවල්. සමහරු රැවුල් වවාගෙන, සමහරු කණ්නාඩි දාගෙන. ඒ වුණත් කතා කරනකොට, හිනාවෙනකොට අර පරණ ඉස්කෝලේ අයව මතු වෙනවා."

කාන්තා පක්ෂයෙන් ඇවිල්ලා උන්නේ චිත්‍ර ලතායි, මල් කාන්තියි විතරයි. ඒ අයගේ මහත්තුරුත් එක්කයි ඇවිත් උන්නේ. පන්ති මිත්‍රයන්ගේ නෝනා මහත්තුරු කීපදෙනෙකුත් ඇවිත් හිටියා.

රහ මෙර පානය කළාම ආපහු ගෙවල් වලට යනකොට වාහන පදවන්න බැරිනිසා සමහරු නෝනා මහත්තුරු එක්ක ඇවිත්. පන්, පින්, පැන් තුන්දෙනා සුපුරුදු විදියට ගියේ එක වාහනේක. පන් රහමෙර පානයෙන් තොර හන්ද වාහන පැදවිල්ල ප්‍රශ්ණයක් වුණේ නෑ. අපේ අයට "පැරට්" එකතු වුණා.

"පැරට්" කියන්නේ අන්වර්ථ නමක්. නැත්නම් " නික් නේම්" එකක්. තොරතෝංචියක් නැතිව ගිරවෙක් වාගේ කියවන හන්ද ඒ පන්ති මිත්‍රයාට අනික් මිත්‍රයෝ කිව්වේ "පැරට්" කියලයි.

අන්වර්ථ නම් ගැන කියන කොට මතක් වෙන දේවල් නම් බොහෝමයි... ඒවා මේ වාගේ ලියවිලි වල ලියන්නත් බෑ වගේ. අන්වර්ථ නම් හදගෙන තිබුණේ පන්ති මිත්‍රයින්ට විතරක් නෙවි. ගුරුවර ගුරුවරියන්ටත්. අපේ කට්ටිය පාන්දර වෙනකල්ම කරපු අල්ලාප සල්ලාප වලදී හුඟ දෙනෙක්ව ඇඳින්නුවේ අන්වර්ථ නම් වලින්.

එතෙන්ට ඇවිත් උන්නු සමහර මිත්‍රයින්ගේ නියම නම් බොහොම අමාරුවෙන් මතක් කරගෙන ඒ නමින් කතා කරන්න වුණේ නෝනා මහත්තුරුත් ඉන්න තැන අර අන්වර්ථ නම් වලින් කතා කරන්න බැරි හින්දයි. මොකද වැදගත් මහත්තුරු වාගෙ හැසිරෙන්නත් එපායැ. ඊත් රහමෙර පානය කරපු මිත්‍රයින්ට නම් වැඩිය ගාණක් වුණේ නෑ වගේ.

"ජීවිත කාලයේදී ලබන්න පුළුවන් හොඳම මිත්‍රයෝ ලැබෙන්නෙ ඉස්කෝලේ කාලයේදී. පන්තියේදී. මොකද තාරාතිරමක්, වත් පොහොසත්කමක්, මොකුත් නෑනේ. " පන් අදහසක් ඉදිරිපත් කළා. "ඔව් ඉතින් පහු කාලෙක සමාජයත් එක්ක ගැටෙන කොටනේ සමාජ විෂමතා ඔලුවලට රිංගාගන්නේ." පැන් ඊකට එකතු වුණා.

"අපිට එද වාගෙම අදත් විවෘතව කතා කරන්න පුළුවන් වෙන්නේ වැඩිපුර පන්ති මිත්‍රයෝ එක්ක කියලයි හිතෙන්නේ." ඒ පැන් .

කියන්න තියෙන දෙයක් ඇත්නම් මුණටම කියන්න බයවෙන්න දෙයක් නෑනේ" ඒ වගේ උදවිය අවශ්‍යයයි ජීවිතයට. තමන් ට තමන් ගැන, තමන් කරන කියන දේ ගැන අවංකව, විවෘතව කතා කරන අයගෙන් තමයි තමන්ට හැදෙන්න පුළුවන් වෙන්නේ." පින් කතාවට එකතු වුණේ මොකක්දේ වැඩක ඉන්න ගමන්.

"තමන්ගේ හිතට ආව බරක්, කේන්තියක්, දුකක් විවෘතව කියන්න පුළුවන් වෙන්නෙත් ඒ වාගේ මිත්‍රයින්ට විතරනේ. එහෙම කිව්වම ලැබෙන අස්වැසිල්ලම මදිද ? නිදහසේ තමුන්ගේ අදහස් බෙදා හදගන්නවා වගේම ඒ අයගේ අවංක අදහස් තමන්ගේ කටයුතු වලට ගන්න එකත් වටිනවානේ.

"කට්ටිය එකතුවෙලා සංගමයක් වාගෙ දෙයක් හදගත්තොත් මොකද ? " සාදයේදී පින් හදිස්සියෙන් මතක් වෙලා වගේ ඇහුවා.
"ඒ මොකට ද ? ඉස්කෝලෙට ළමයි දමාගන්නද ? මුණුපුරාලා මිණිපිරිගේ තමයි දැන් ඉතින් දගන්න වෙන්නේ" පැන් හිනාවුණා.

"නෑ මං කියන්නේ, එකතුවෙලා මොනවා හරි අනුන්ටත් වැඩක් වෙන දෙයක් කරන්න පුළුවන්නේ ? කෑමට බීමට විතරක් මෙහෙම එකතු වෙනවාට වැඩිය හොඳ නැද්ද ඒක."
"ලාභට ගෙම්බෝ එකතු කරනවා වාගේ වේවි. ලේසි වෙන එකක් නෑ ඒ වැඩේනම් ..." මිස්ට "පතෝල" කිව්වා.

"අනික වැඩක් කරන්න සංගම් හදගන්නම ඕනෙද ? සංගම් අටවාගත්තම තනතුරු හැදෙනවා. අන්තිමට වෙන්නේ තම තමන් බබලන්න තනතුරු වලට තරඟ වදින එක. ඊකෙන් අර පරණ හිතවත්කම් පවා නැතිවේවි." ඒ අපේ "ගල් ආඳ" මහත්තයා.
"එහෙම කියන්න එපා. සාර්ථකව කරගෙන යන සංගම් කොයි තරම් තියෙනවා ද ? "පන්ට" "ආඳ" මහත්තයාගේ කතාවට තරහත් ගියා.

"මම හිතන්නේ මේ විදියටම අයෙත් මුණගැහෙන්න පුළුවන්නම් එක් වැඩියෙන් සුන්දර වේවි."

"සංගම් වලට ව්‍යවස්ථා හදන්නයි, ලියාපදිංචි කරන්නයි, වාර්තා ලියන්නයි, අය - වැය හදන්නයි ගියාම වෙන දෙයක් කරන්න වෙලාවක් ඉතුරු වෙන එකක් නෑ මට හිතෙන්නෙ.
"ඊකට අපි සංගමයක් වෙනුවට "සංසදයක්" හදමු." පන් යෝජනා කළා. තනතුරු නැති, ව්‍යවස්ථා නැති, අය - වැයක් නැති නිකම්ම නිකං එකක් !"

"ඊකට අපි " හිතුමතේ සංසදේ " කියලා නම දාගමු." " පැරට්" ගේ කට ඉස්සර වෙනවා හැම තිස්සෙම.
"විහිළු නෙවි මෙයා, සීරියස්ලි ! අපි හොඳ නමක් දාගනිමු !"
මල්කාන්ති පන්ගේ යෝජනාවට උනන්දුයි."

"මල්කාන්ති ඉතින් කවදත් පන්ගේ දේවල් වලට උනන්දුයිනේ ..." "පැරට්" මල්කාන්තිගේ මහත්තයා දිහා හොරෙන් බලන ගමන් හීනි ඇණුම් පදයක් යැව්වා..."

"උඹ ට්‍රයි කරලා බැරවුණාට පන් මක් කරන්න ද ? " චිත්‍රලතා කෙළින්ම කියලා "පැරට්" ව වලංගු කරගත්තා. පන් අදටත් තනිකඩව ඉන්නේ මල්කාන්ති හන්ද බව දන්නෙ චිත්‍රලතා විතරයි.

"අපේ සංසදයට අපි "පන්ති මිත්‍ර සංසදය" කියලා නම තියමු.

"ඒක හොඳයි, අදලයි, කැපයි තීන්දුයි ! "මාස්ටර්" ඒ නම ස්ථිර කළා. "මාස්ටර්" කියන්නෙත් පන්ති මිත්‍රයෙක්ගෙ අන්වර්ථ නමක්.
"පන්ති මිත්‍ර සංසදයේ ජ්‍යෙෂ්ඨයෝ, කණිෂ්ඨයෝ නෑ හැමෝම එක පන්තියේනේ..."
"වීරයෝ, අහිංසකයෝ නෑ... හැමෝම එකයි. "
"හයි - ෆයිලා, ලපයි - සිපයිලාත් නෑ. හැමෝම එක පන්තියේ"

"වැඩක් කරන මනුස්සයා තමයි "වැඩකාරයා" වැඩේ දන්න එක්කෙනා තමයි ඒ වැඩේ දී උපදේශකයා. ස්ථිර උපදේශකයෝ නෑ."

"ඒ කියන්නේ කොට අඳින ඇත්තුයි, පෙරහැරේ යන ඇත්තුයි කියලා ඇත්තු දෙගොල්ලක් නෑ. කොටන් ඇඳගෙන පෙරහැරේ යන ඇත්තො තමයි අපේ ඇත්තු !"

"දැන් මේ සංසදයෙන් මොනවද කෙරෙන්නේ අනේ ?" මල්කාන්ති ඇහුවා.

"හොඳ ප්‍රශ්ණයක් !" පන්ගේ නළල රැළි ගැහුණා.
"පන්ති මිත්‍ර ඩිනර් ඩාන්ස් එකක් ?"
"පන්ති මිත්‍ර ට්‍රිප් එකක් ?"
"පන්ති මිත්‍ර ටැලන්ට් ෂෝ එකක් ? "
"පන්ති මිත්‍ර වර්ක් ෂොප් එකක් ?"

ඔහෙම නෙවි. අපි වෙන විදිහෙ දෙයක් කරමු. මේ රටට ඉගෙනගන්න, රස්සාවල් කරන්න, පදිංචි වෙන්න ඇවිත් අමාරුවෙන් ඉන්න අපේ අය ගැන හොයලා බලලා උදව් වෙමු !"

"අර ශාන්ති පොඩි මහත්තයා නෝනා මහත්තයා උතුරු මෙල්බර්න් වැඩිහිටි සුභසාධක සංගමය හවුල් කරගෙන අර ලංකාවේ අපේ පුංචි ක්‍රීඩා හපන්නු මේ රටට ගෙන්නවලා ලංකාවට කීර්තියක් අත්කරලා දුන්නා වගේ හොඳ දෙයක් කරමු.

"අපේ දේවල් රැකෙන විදියේ වැඩක් කාටත් දැනෙන්න කරමු."
"හොඳ දෙයක් කළොත් අපිට උදව් කරන්නත් අය ඕන තරම් එක් වේවි !"
"හොඳටම රෑ වුණා. දැන් යමු නේ ?" චිත්‍රලතා හරිබරි ගැහුණා.
"රෑ වුණා නෙවි; එළි වේවි මෙතනම ! " පැන් කිව්වා.

"එහෙනං ෂැල් වී මේක් අ මුව් ? " (Shall we make a move?) මාස්ටර් ඇහුවා.

"ඒ අහන්නේ "අපි මුව හදමුද ? කියල ද ? " පැරට්ගේ කටට එන්නෙම ඔය වාගේ හරුප.

"හා ඇති, ඇති. හැමෝටම ලබන්නා වු 2013 වසර ශුභ නව වසරක් වේවා ! කියලා පතනවා. ඔන්න එහෙනං අපි ගියා."

■


## Do you need
Your Own Sri Lankan Accountant With

>> Personalized Advice at Any Time
>> Pre Agreed Fixed Fee & No More Surprises
>> Always Close to Your Business Physically and in Mind

"We will take care of you"



Over 10 Years Experienced Service For

- Individual and Business Tax Returns
- GST & BAS
- Bookkeeping Services (MYOB and QuickBook)
- Business Start Up Solutions (Incorporations & System Design)
- Software Training
- Small Business Advice and Training

Amali Liyanage
"Advance Tax & Business Consultant"
M.Com.B.Sc.ASA,
Registered Tax Agent

M : 0433 732 854
e : advanceab@gmail.com
1/98, Plumpton Av
Glenroy - 3046

SAAMART.COM.AU